රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 13/99

මගේ අංකය : ආ/III/2/8-5
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ:07.

1999.06.11 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්ලිමේන්තු ප්‍රධානීන් වෙත.

**රජයේ අනුමැතිය ඇතිව විදේශ අරමුදල් යොදන අමාත්‍යාංශ යටතේ ඇති ව්‍යාපෘතිවල සේවය කිරීම සඳහා රජයේ නිලධාරීන්ට වැටුප් රහිත නිවාඩු ආයතන සංග්‍රහයේ <u>XII පරිච්ඡේදයට සංශෝධන</u>**

1991 නොවැම්බර් 10 දිනැති අංක 52/91 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අවධානය යොමු කරවනු මැනවි.

02. ශ්‍රී ලංකා රජයේ ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 16:1:4 උපවගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට තීරණය කරනු ලැබ ඇත.

"16:1:4 රජයේ එකඟත්වය ඇතිව ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ පිළිවෙල, ලෝක සෞඛ්‍ය සංවිධානය ආදී විදේශ නියෝජිත ආයතනයන්හි රැකියාවක් කිරීම සඳහා සේවයේ ස්ථිර කරන ලද රාජ්‍ය නිලධාරීන්ට වසර පහක් (05) නොඉක්මවන කාලයක් සඳහා වැටුප් රහිත නිවාඩු දිය හැකිය. රජයේ අනුමැතිය ඇතිව විදේශ අරමුදල් යොදන, අමාත්‍යාංශ යටතේ ඇති ව්‍යාපෘතිවල රැකියාවක් කිරීම සඳහා ද මෙම විධිවිධාන අදාළ වේ".

**ජී.ඒ. සේනාරත්න**
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය